ස්වාභාව ධර්මය යනු ආශ්චර්යමෙත් නිර්මාණ රැසක සහ සංසිද්ධීන් මාලාවක එකතුවකි. අප වටා ස්වාභාවිකම පවතින මේ ජීව අජීව වස්තූන් සහ සිදුවන සංසිද්ධීන් පිළිබඳව පහද විස්තර කිරීමට නොහැකි වූ පැරැන්නෝ විවිධ දෙවිවරුන් මවා ස්වභාව ධර්මය උනු පිට පැටවූහ. ස්වාභාවික නීති පද්ධතිය තුල ලෝකයේ සියළු දේ නිර්මාණය වී ඇත්තේ සහ පවතින්නේ ඒ සියළු දෙයෙහි ඉදිරි පැවැත්ම සඳහාම ය. අප කුඩා කල ඉගෙන ගත් පරිදි කුඩළු ගෙඩි හොඳින් පැසුණු පසු පිපිරි එහි ඇට දසත විසිරෙන්නේ ද, හොර මල් වායු ප්‍රතිරෝධය සහිතව පැරශූට මෙන් පියාඹන්නේ ද, පොල් ගෙඩියක පිටත ඇති කොහු ලෙල්ල සහ ඝණැති කටුව එලෙසින් නිර්මාණය වී ඇත්තේ ද, රසැති කජු පුහුලම කජු ගෙඩියට පිටින් පිහිටා ඇත්තේ ද, පේර ගෙඩියක ඇට ඇතුලේ පිහිටා ඇත්තේ ද, ඒ ඒ ශාකයේ ඉදිරි පැවැත්ම සහතික කරනු වස් අවට ඇති වෙනත් ජීවී මෙන්ම පරිසර පද්ධති සමග ගනුදෙනු පහසු වෙනු පිණිසය.

හරියටම කජු ගෙඩිය තිසි පරිදි මෝරා සැකසී එන කාලයේ දී ම පුහුලම පැණිණබර වී ඉදෙන්නේ කුරුල්ලන් ළඟා තම වර්ගයා සතර දෙසටම පතුරවා ගැනීමටයි. මිනිස් ප්‍රජාවේ ද සිරුර තුල සිදුවන සියළු හෝමෝන ක්‍රියාකාරකම් ශාරීරික වර්ධනය හා සමාන්තරව සිත තුල රාගික හැඟුම් උපදින්නේ මේ නිසාය. ආදරය යනු රාගය නමැති ප්‍රධාන ආහාරයට පෙර අනුභව කෙරෙන කටගැස්මක් පමණක් බව මගේ අදහසයි.

මිනිසා නමැති සත්වයා මේ කටගැස්ම රස විඳින්නට හුරු පුරුදු වන්නේ කුඩා කාලයේදී ම බව කියවේ.

දෙකේ තුනේ පන්තිවලදී පවා කොල්ලන් සහ කෙල්ලන් ගේ නම් පටබැඳ උසුළු විසුළු කතා කියවෙන්නේ එ නිසාය. එසේම ඒ සමයේදී විරුද්ධ ලිංගිකයින් දකින විට ලියනගේ අමරකීර්ති තම

පමා නොවී එම් අකුරට

රසික සූරියදාරච්චි ලියයි

එකී සියයට පණහ ඇත්තේ එක සිතක පමණක් නම් සහ ඒ ආදරය අප්‍රකාශිත එකක් වුවොතින් ය. මගේ ගැටවිර විය පිරි තිබුණේ ඒ ආකාරයේ අසාර්ථක අත්දැකීම් රාශියකින් පමණක් බව අද සිහිවෙන විට ඇතිවන්නේ තරමක කණගාටුවකි.

නමුත් ඒ තත්වය මට පමණක් සීමා වුවක් නොවේ. අපේ කාලයේ මගේ සම වයසේ සිටි බොහෝ ගැටවරයෝ මේ බෝට්ටුවේම නැගී ජීවන සසුරේ යාත්‍රා කරමින් වැඩිහිටි විය කරා ගමන් කළහ.

මේ දුබඳයක තත්වය ඇති වූයේ ආදර සිතුවිලි බිහිකරනා හෝ-මොනවල අඩුවක් නිසා නොවේ. ඒ ඇතිවුණු ආදර සිතුවිලි ගද්‍යයෙන් හෝ පද්‍යයෙන් හෝ ලිවීමට තිබූ කිසියම් ආකාරයක

බැරිවුණි කියාගන්නට සිත බැඳි ආලේ!

සාහිත්‍ය සම්මාන දිනූ -අටවක පුත්තු" කෘතියේ ලියූ පරිදි මගමාල ඛියක් ඇතිවන්නේ ද ඒ නිසාය.
එසේ වුවද, පිරිමියෙකු ගේ සිතේ නම් සැබෑ ලෙසම බලවත් ආදර සිතුවිලි ඇතිවනේ අවුරුදු දසයේ දී පමණ බව මගේ අත්දැකීමයි.

මේ වයසේ පසුවන ගැටවරයෙකුට ලැබිය හැකි දරුණුතම දඬුවම නම් බාලක පාසලක ඉගෙනුම ලැබීමට සිදුවීමයි. තම සහයට සම වයසේ මිතුරන් නොමැතිව තනිවම කටයුතු කරන්නට සිදුවීමේ දඬවම ඇත්තේ ඊ ලඟටය. ඒ දිවිත්ව දඬුවම් එක හා සමාන්තරව විඳීමට සිදුවුවද, සතියේ දින පහක් තිස්සේ සුදු පැහැ නිල ඇඳුමින් සැරසී බාලිකාවන් පාසල් යනෙන දුම්රියේ ම ගමන් කිරීමට ලැබීම නම් යම් සැනසිල්ලක් ගෙන දුන් ඉරණමක් බව කිව හැකි ය.

එහි සොඳුරු අතුරුඵලයක් ලෙස, සම වයසේ බාලිකාවියක කෙරෙහි ඇතිවුණු සොඳුරු ආදර සිතුවිල්ලක් පෙම් කවියක් බවට මුලින්ම පෙරළි මා ලියූ සිය ගනනක් පෙම් කවිවල ආරම්භය සනිටුහන් කරමින් මා අතින් ලියවුනේ හරියටම මගේ වයස අවුරුදු දසයයි මාසයේ දී ය.

මේ ඒ කවියයි!

ඔබ නිසාය

ඈත අහසෙ පාවි පාවි
හෙමින් හෙමින් ඇදිලා යන
පුළුන් වලාකුළු වල ඇති
සුන්දර බව මා දුටුවේ
සඳ පෑවූ රෑ යාමේ
එහෙන් මෙහෙන් පොකුරු පොකුරු
පිපිලා ඇති තරු මල් වල
අමුතු ලස්සනක් දුටුවේ
කිවි බිවි ගා කෑ ගසමින්
ලිය ගොමුවල දුව පනිනා
පුංචි බටිති මළිනන් ගේ
ගී නාදය කන වැටුනේ
සුපිපුණු අරලිය මල්වල
සුවඳින් මා සිත පිරුනේ
බැස යන තිරු ගේ දසුනේ
නොදුටු ලස්සනක් දුටුවේ
කුමරිය ඔබගේ දෙනෙතින්
මා හද පණ ලැබූ නිසාය
ඔබ දෙනෙතේ මුව මඩලේ
රැඳී තිබුණු ඒ කැල්මෙන්
මා සිත පිබිදුණු නිසාය
මා ජීවය ලද නිසාය

සිතෙහි ඉපදී කවි බසින් පිටවෙන ආදර හැඟුම් අභ්‍යාස පොත්වල බෝල්පොයින්ට් අකුරින් ලියූ පමණින් කිසිවක් සිදු නොවේ. එසේම, සියයට පණහක් පමණක් සාර්ථක ආදරයකින් ඇති කිසිදු ප්‍රායෝගික ප්‍රයෝජනයක් ද නැත. ඒ විශේෂයෙන්ම

අසීරුකමක් නිසා ද නොවේ. ඒ සියල්ල අඩුවක් නොමැතිව තිබුණි.

නමුත් මෙහිදී පැවති අඩුව තිබුණේ ධෛර්යයේ ය. සමවයසේ බාලිකාවක් ඉදිරියට ගොස් තම සිතුවලි නොවලහා ප්‍රකාශ කරන්නට අවශ්‍යවූ ධෛර්යයේ ය. ඒ ධෛර්යය නොමැති වූ කළ, මනෝ ලෝකයේම දිගින් දිගටම සිරවී සිටීම හැර වෙනත් විකල්පයක් නොමැත.

මානව විද්‍යාව හෝ පරිනාමවාදය හෝ ජීව විද්‍යාව හෝ හදරන්නෙකුට මේ සම්බන්ධයෙන් ඇතිවිය හැකි එක් ප්‍රශ්ණයක් වනුයේ, ශාරීරික වෙනස්කම් වලට සමගාමීව ඇතිවන හෝමෝන වර්ධනයෙන් බිහිවෙන ආදරය, ප්‍රකාශ කිරීමට අවශ්‍ය ධෛර්යය ඒ සමගම සිතේ ඇති නොවන්නේ ඇයිද යන්නයි.

එය පරිනාමයේ දී සිදුවුණු වරදක්ද? වෙනත් ජීවීන් අතර මෙවැනි කුඳෑට් කම් ඇති බවක් අප අසා නොමැත!

මල්වර වෙලා නුඹ ඉඳගිට දුටු වේලේ
බැරිවුණි කියාගන්නට සිත බැඳි ආලේ

යැයි අමරදේව ගයන්නේ මෙවැනි සියයට පනහේ අප්‍රකාශිත ආදරයක් ගැනයි.

■

සුබස් සිත්වල

වි ක ධර්මබන්ධු

සුභාෂිතයෙන්....

මිනිස් හට සොඳුරු ගුන සහ නුගුන	ඇත
නිදෙස් කෙනකු මෙ දියත උපදිනේ	ඇත
වෙසෙස් සිනිඳු මුවරද බර සහස්	පත
කොරොස් නලින් යුතු වෙය් කටු පෙලිනි	යුත

මෙය ම ගැදි පැදියකින් :-

මිනිස් හට
සොඳුරු ගුන සහ
නුගුන ඇත
නිදෙස් කෙනකු
මෙ දියත උපදිනේ නැත
(වෙසෙස්) සිනිඳු මුවරද බර
සහස්පත
කටු පෙලිනි යුත
කොරොස් නලින් යුතු වෙය්.

මෙහි අදහස:-

මිනිසුන් කෙරෙහි යහපත් ගුන මෙන්ම අයහපත් ගුනද ඇත්තේ ය. දෙසක් නැති කෙනකු මෙලොව (ගම) උපදින්නේ නැත. (බුදුන් වහන්සේ නම් කිසිදු දෙසක් නැති කෙනකු බව කියති.) (විශේශයෙන්) සිනිඳු වූ රේනු පිරි ඇති නෙලුම් කටු සහිත නටුවකින් යුක්තය.

පැහැදුම:-

මිනිස් හට, ගොන් හට, ඇත් හට, අස් හට ආදි වශයෙන් පියවියට හට නිපාතය එකතු කිරීමේ සිරිතක් සාමාන්‍ය වියහරේ දක්නට නැත. මිනිසුන-"ට යන පදය නම් -මිනිස් හට" යනුවෙන් වෙනස් වේ. ගොනුට, ඇතුට, අසුට වැනි යෙදුම් සමහර පරනි ගැදි පොත්වලද දක්නට ලැබේ.

කෙසේ වෙතත් මෙහි ඇති "මිනිස් හට" යන්නේ ඇත්තේ "මිනිසුන් හට" යන බහු වචන අර්ථය බව මගේ හැඟීමයි. එහෙත් බොහෝ උගතුන් එහි තේරුමට "මනුශ්‍යයා හට" යන ඒක වචන අර්ථය දී ඇත්තේ කවර හෙයින් දැයි මම නොදනිමි.

රස / නිරස, සුදුසු / නුසුදුසු, මනා / නොමනා, ගුන / නුගුන යනු වියහරේ පවතින රීතියයි. ගුනවත් යන්නේ සොඳුරු /මනා / යහපත් ගුන ඇති යන තේරුම ගැබ් වී ඇත. (සොඳුරු ලොප් කොට) -මිනිස්හට ගුන සහ නුගුන ඇත" යන්නේ ඇත්තේ එම තේරුමයි.

වෙසෙස් යන පදයෙන් මෙහි අදහසට එළියක් නොවැටේ. එය "සක්ක" පදයකි. "මකරන්ද" යන්න මුවරද /මුවරද යන දෙවිදියටම වියහර වේ. " බාන්ඩ" බඩු විදියටත් "කන්ඩ" කඩ විදියටත් වියහරට පැමින ඇත.

ඉංගිරිසියෙන් "මෙරිගෝල්ඩ්" යනුවෙන් හැඳින්වෙන මල අප හඳුන්වන්නේ දස් මල හෝ දස් පෙති මල යනුවෙනි. දහසක් ම නැතත් ඒ මලක පෙති සිය ගනනක් ඇත. මෙහි "සහස් පත" යනුවෙන් හඳුන්වන්නේ ඒ මල නොවේ; පෙති සියයක් වත් නැති නෙලුම් මලය්. බොහෝ පොත්වල දක්නට ලැබෙන්නේ "සියපත" යන වචනයයි.

නෙලුම් අලයේ මෙන්ම නෙලුම් දඬුවලත් නටුවලත් සිදුරු දක්නට ලැබෙන නිසා මෙහි "නල" යන්න යොදා ඇතත් "රෝස මලේ -නලයෙ" කටු" නිවැරදි නොවේ.

කොරොස් යනු කර්කශ /රලු යන තේරුම ඇති පදයකි. ගොරහැඩි /කොරහැඩි යනුවෙන් එය සාමාන්‍ය වියහරේ පවතින්නේ.

මේ වන තෙක් මිනිසුන් සුදන - දුදන යනුවෙන් බෙද දැක්වූ මේ කතුවරයා මෙතැන ගසන්නේ අලුත් / වෙනස් පදයකි. උස් / මිටි, කලු / සුදු වශයෙන් මිනිසුන් බෙදන විදියට සුදනත් /දුදනත් වශයෙන් මිනිසුන් බෙද දැක්විය නොහැකි බව මා නොයෙක් වර කියා ඇත. බුදුන් වහන්සේ සර්වතෝබ දර කෙතැකයැ් කියන නිසා මෙහි කියන විදියට -නිදෙස් කෙනකු මෙ දියත උපදනා නැත" යන්න සැකයට බාජන වේ. එසේම සුදන ගුනත් දුදන ගුනත් ඇති මිනිසුන් ගැන සිතා සු දු දන - සුදුදන යනුවෙන් අලුත් වචනයක් ද සද ගත හැකිය. කෙසේ වෙතත් බන පොතේත් සුබාෂිතයේත් ගැටුමට අත දමා අත පුලුස්සා ගැනීමට මම නොකැමැත්තෙමි.